දැන්වීමයි

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම (විවෘත) - 2021

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.08.31 වන අතර, බඳවා ගැනීමේ තරග විභාගය 2021 නොවැම්බර් මස අනුරාධපුර නගරයේදී පැවැත්වීමට නියමිත වේ.

02. පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.

	තනතුර		**පුරප්පාඩු ප්‍රමාණය**
i.	කාර්මික නිලධාරී (විදුලි) iii ශ්‍රේණිය	-	03
ii.	කාර්මික නිලධාරී (යාන්ත්‍රික) iii ශ්‍රේණිය	-	01
iii.	කාර්මික නිලධාරී (සිවිල්) iii ශ්‍රේණිය	-	35
iv.	කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක)		
v.	කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක)		

03. සුදුසුකම්:

3.1 පොදු සුදුසුකම්

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, සෑම අයුරකින්ම සුදුසු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

V. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලද නිලධාරීන් ඉහත තනතුරු සඳහා අයදුම් කරන්නේ නම් ඔවුන්, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය. එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

VI. අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් උතුරු මැද පළාත තුළ ස්ථිරව හා අඛණ්ඩව පදිංචි අයෙකු විය යුතුය. **සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් උතුරු මැද පළාත තුළින් තෝරාගැනීමට නොහැකි වුවහොත් පමණක් , උතුරු මැද පළාතේ අවම වශයෙන් අවුරුදු 10 ක් සේවය කිරීමේ ගිවිසුමකට එළඹීමට යටත්ව දීපව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සළකා බලනු ඇත.**

3.2 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්:-

(අ) සියලුම තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්:-

1. අ.පො.ස.(සා . පෙළ)
   භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින්(06) එකවර සමත්වීම.
2. අ.පො.ස.(උ. පෙළ)
   ව්‍යවහාර ගණිතය/ශුද්ධ ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව/ ඉංජිනේරු තාක්ෂණවේදය, සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහිතව අ.පො.ස.(උ/පෙළ) විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් විෂයයන් 03 කින් එකවර සමත්වීම

(ආ) වෘත්තීය සුදුසුකම්

තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී iii ශ්‍රේණිය (සිවිල්/යාන්ත්‍රික/විදුලි)

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරි නමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක)

I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම (උදාහරණ:- ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්/විදුලි/යාන්ත්‍රික)

හෝ

II. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම

හෝ

III. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

හෝ

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම

කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක)

තාක්ෂණික සුදුසුකම් අදාළ නොවේ.

සටහන :- ඉහත 3.2 පරිදි නියමිත අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් උතුරු මැද පළාත තුළ නොමැති වුවහොත් පමණක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 හි විධිවිධාන අදාළ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

04. වැටුප් ක්‍රමය:

(අ) තාක්ෂණ සේවයේ iii ශ්‍රේණියේ තනතුරු සඳහා හිමි වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව වැටුප් කේත අංක MN3-2016 යටතේ රු.31,040-445X10-660X11-730X10-750X10-57,550/= (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. ඊට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනා රු 7800/= ක් සහ විශේෂ දීමනා රු.2500/= ක් මාසිකව ගෙවනු ලැබේ.

(ආ) පුහුණු ශ්‍රේණි සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව රු.27,140.00 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

කාර්මික නිලධාරී iii ශ්‍රේණිය (සිවිල්/යාන්ත්‍රික/විදුලි) තනතුරු සඳහා

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත්වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටියේ නම් ඔවුන් නියමිත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තුන් අවුරුදු පරිවාස කාලය අවසානයේ අදාළ තනතුරෙහි ස්ථිර කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වනු ඇත.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා

(අ) කාර්මික නිලධාරී (සිවිල්) iii ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව 02 ඡේදයේ දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට ප්‍රමාණවත් නොවන විට ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් අනුව එක් අවුරුදු හා දෙ අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණි සඳහා බඳවා ගනු ලැබේ.

(ආ) නියමිත පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන විභාගයෙන් සමත්වන අය පමණක් කාර්මික නිලධාරී iii ශ්‍රේණියේ තනතුරට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

06. භාෂා මාධ්‍යය :

විභාගය සිංහල, දෙමළ, භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අයදුම්පත්‍ර :

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී 21X30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහිද, අංක 04 සිට 07 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව සම්පූර්ණ කළ යුතුය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021............ දිනට පෙර "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (තනතුරු නාමය) සඳහා බඳවා ගැනීම(විවෘත) - 2021" (ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න) යන්න සඳහන් කළ යුතුය. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

(ඇ) ඉල්ලුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.

(ඈ) රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) මූලික සුදුසුකම් සපුරා නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, උතුරු මැද පළාතේ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර වෙනත් ස්ථානවලට මුදල් ගෙවූ රිසිට්පත් සහිත අයදුම්පත්(උතුරු මැද පළාත තුළ පදිංචි අයදුම්කරුවන් සඳහා පමණි), මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඊ) අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු,සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු හෝ රජය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

08. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාග ගාස්තු ලෙස රු. 600.00 ක මුදලක් උතුරු මැද පළාත් සභාවේ ආදායම් ශීර්ෂ අංක 2003.02.13 ට බැර වන පරිදි (එන්සී 100 ආකෘතිය මගින්) උතුරු මැද පළාත තුළ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත් සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ. **පිට පළාත් අයදුම්කරුවන් සඳහා පමණක් ලංකාවේ ඕනෑම ස්ථානයක පිහිටි ලංකා බැංකු ශාඛාවකින් , ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු මැද පළාත, ගිණුම් අංක 1472199 දරන ගිණුමට අදළ විභාග ගාස්තු මුදලින් බැර කළ හැකි අතර, ලබා ගන්නා ලද තැන්පතු පත අයදුම්පත්‍රයේ අදළ ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න.** විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් බාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල්ද භාරගනු නොලැබේ.

(ආ) මෙම නිවේදනයේ 3.1 සහ 3.2 ඡේදවල සඳහන් සුදුසුකම් සපුරා ඇති , නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඇ) විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07කට කලින් විභාග ප්‍රවේශපත් නොලදහොත් එම අයදුම්කරුවන් සියලු විස්තර ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලියා දැන්විය යුතුය. (දුරකථන අංකය: 025-2222773 ෆැක්ස් අංකය:-025-2224447)

09. තෝරාගැනීමේ ක්‍රමය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව අනුරාධපුර හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ලකුණු ප්‍රමුඛතාවය හා සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර, ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සළකා බලනු නොලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් ලකුණු කුසලතාවය අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගනු ලැබේ.

සටහන :- ප්‍රමුඛතා ලේඛන සකස් කිරීමේදී උතුරු මැද පළාත හා වෙනත් පළාත් සඳහා වෙන වෙනම ප්‍රමුඛතා ලේඛන සකස් කරනු ලබන අතර, උතුරු මැද පළාත් ප්‍රමුඛතා ලේඛනයට අනුව අවම සමත් ලකුණු දරන අයද තෝරා ගැනීමෙන් පසු වෙනත් සුදුසුකම්ලාභීන් පිළිබඳව සලකා බලනු ලැබේ.

10. විභාග ක්‍රමය:

තරග විභාගය පහත සඳහන් පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01යි. - ලකුණු 100.
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය : කාලය පැය 03 යි - ලකුණු 100

විෂයය නිර්දේශය

තාක්ෂණ සේවයේ සියලුම තනතුරු සඳහා බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. සියලුම තනතුරු සඳහා වන අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටිය යුතුය. සමත්වීම සඳහා 40% හෝ ඊට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

(අ) තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියේ /පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා
මෙහිදී සිවිල් නිලධාරියකුට තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජලාපවහන සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

(ආ) තාක්ෂණ සේවයේ (යාන්ත්‍රික) III ශ්‍රේණියේ තනතුර සඳහා
මෙහිදී තනතුරට අදාලව තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

(ඇ) තාක්ෂණ සේවයේ (විදුලි) III ශ්‍රේණියේ තනතුර සඳහා
මෙහිදී තනතුරට අදාලව තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

11. සාවද්‍ය තොරතුරු සැපයීම:

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහු සේවයෙන් පහකරනු ලැබේ.

12. විභාගය පවත්වන දිනය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථා කාලයේදී දැනුම් දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියමකළ පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටී. මෙම විභාගය පැවැත්වීම, පත්වීම ලබා දීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

13. බඳවා ගැනීමේ කොන්දේසි, තනතුරට අදළ වන උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව තීරණයවේ. මෙම දැන්වීමේ භාෂා පාඨ අතර යම් අනනුකුලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

තේජානි තිලකරත්න,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2021.07.16

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ☐

උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය(විවෘත) - 2021

ඉල්ලුම් කරන තනතුර :- ....
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය(සිංහල - 2, දෙමළ -3)
(භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)
(අදළ අංකය කොටුව තුළ ලියන්න) ☐

1.0 1.1 මුලකුරු අගට යොද මුලකුරු සමග නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ....
(උදා: GUNAWARDHANA H.M.S.K.)
1.2 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ....
(උදා:- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්) ....
1.4 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ....
2.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්) ....
2.3 ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ....
....
....

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
3.3 2021.08.31 දිනට වයස අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐
3.4 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:..........................
3.5 දුරකථන අංකය :-ස්ථාවර .... ජංගම..........................

4.0 අධ්‍යාපන සුදුසුකම්

4.1 අ.පො.ස(සාපෙළ) විභාගය පිළිබඳ විස්තර:- (සහතික පිටපත් අමුණා එවිය යුතුය)

වර්ෂය		**විභාග අංකය**	
විෂයය	**සාමාර්ථය**	**විෂය**	**සාමාර්ථය**
1.		6.	
2.		7	
3.		8.	
4.		9.	
5		10	

4.2 අ.පො.ස(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :- (සහතික පිටපත් අමුණා එවිය යුතුය)

වර්ෂය හා මාසය		**විභාග අංකය**	
විෂයය	**සාමාර්ථය**	**විෂයය**	**සාමාර්ථය**
1.		3.	
2.		4.	

4.3 ලබා ඇති වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් අමුණා එවිය යුතුය)

උපාධිය/ ඩිප්ලෝමා/ වෘත්තීය සහතිකයේ නම	**ප්‍රතිඵල වලංගු වන දිනය**	**විෂයයන්**	**සාමාර්ථතාව**	**නිකුත් කළ ආයතනයේ නම**

5.0 වෙනත් සුදුසුකම්..........................

6.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදළ කොටුවේ ✓ ලකුණ යොදන්න)
ඔව් ☐ නැත ☐
ඔව් නම් විස්තර සඳහන් කරන්න ....
....

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර
7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය ....
7.2 ලදුපතේ අංකය හා දිනය ....
7.3 ගෙවූ මුදල ....
ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න)

8.0 ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්,
8.1 දෙපාර්තමේන්තුව/ආයතනය :..........................
8.2 දැනට දරන තනතුර:..........................
8.3 මුල්පත්වීම් දිනය :..........................
8.4 සේවා කාලය : අවු:.................... ....දින සිට .... දින දක්වා
(ස්ථිර පත්වීම් ලිපියේ පිටපතක් අමුණන්න)

9.0 අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බවත්, ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත්, මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

....
දිනය:.......................... අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම(දැන්වීමේ 7(ඊ) වගන්තිය බලන්න)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....මයා/මිය/ මෙනවිය පෞද්ගලිකව හඳුනන බවත්, ... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය:-.......................... ....
සහතික කරන නිලධාරියාගේ අත්සන
සහතික කරන නිලධාරියාගේ නම:..........................
තනතුර:..........................
ලිපිනය සහිත නිල මුද්‍රාව

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

11.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... මයා / මිය / මෙනවිය .... කාර්යාලයේ / ආයතනයේ ....දින සිට .... තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවද, ඇය / ඔහු මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය:-.......................... ....
ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම:
තනතුර:
ලිපිනය: (නිල මුද්‍රාව තබන්න)